ලොව වටා පුවත් වියමන

දිනපොත

පෙබරවාරි: 03.

නේපාලයේ නව අගමැති ලෙස ජලානාත් කනාල් පත්වේ. හැට හැවිරිදි කනාල් එරට වාමාංශික පක්ෂයක් වන එක්සත් මාක්ස්/ලෙනින්වාදී පක්ෂයේ සහාපතිවරයාය. ඉකුත් වසරේ පැවැති පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු නව අගමැතිවරයෙකු තෝරාපත්කර ගැනීම සඳහා දායය වතාවක් පාර්ලිමේන්තුවේ ජන්ද විමසීම් පැවැත්වුවද ඒ සියල්ල අසාර්ථකවීම හේතුවෙන් මාස හතක පමණ කාලයක් තිස්සේ නේපාල දේශපාලනයේ පැවැති අස්ථාවරභාවය අවසන් කරමින් කනාල් අගමැතිවරයා ලෙස තේරී පත්වූයේ දාහත්වන වතාවට පැවැත්වූ ජන්ද විමසීමේදී පාර්ලිමේන්තුවේ ආසන 598න් 368ක ජන්දය ඔහුට හිමිවීමෙන් පසුවය.

පෙබරවාරි: 09.

පාකිස්ථාන රජයේ වියදම් කපාහැරීම පිණිස ඇමැති මණ්ඩලය කුඩා කිරීමට අගමැති මොහමඩ් රාසා ගිලානිට සහාය පළකරමින් එරට සියලුම ඇමැතිවරු සිය ධූරවලින් ඉල්ලා අස්වෙති.

පෙබරවාරි: 10.

පාකිස්ථානයේ හමුදා පෙළපාලියකට එල්ල කෙරුණු මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකින් සෙබළුන් 27ක් ජීවිතක්ෂයට පත්ව තවත් 30ක් බරපතල තුවාල ලබති. වයඹ දිග පාකිස්ථානයේ මාඩන් නගරයේදී මේ බෝම්බ ප්‍රහාරය එල්ල කර තිබුණේ පාසල් හිල ඇඳුමක් ඇඳ පැමිණි ප්‍රහාරකයෙකු විසිනි. මාඩන් නගරය තලේබාන් ත්‍රස්තවාදීන්ගේ තෝතැන්නක් ලෙස සැළකෙන අතර ප්‍රහාරය තලේබාන් ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාවක් බව එරට ආරක්ෂක අංශ පවසයි.

පෙබරවාරි: 11.

දින 17ක් තිස්සේ පැවැති ජනතා විරෝධතාවලට මුහුණ දිය නොහැකිව ඊජිප්ත ජනාධිපති හොස්නි මුබාරක් සිය ධූරයෙන් ඉල්ලා අස්වේ.

පෙබරවාරි: 12.

පාකිස්ථානයේ හිටපු අගමැතිනි බෙනාසීර් බූතෝ ඝාතනය සම්බන්ධයෙන් එරට හිටපු ජනාධිපති පර්වේස් මුෂාරෆ් අත්අඩංගුවට ගන්නා ලෙස පාකිස්ථානයේ රාවුල් පිණ්ඩිගි අධිකරණයක් වරෙන්තු නිකුත් කළේය. 2007 වසරේ දෙසැම්බර් මස 27 දින රාවුල් පිණ්ඩිගි දී බූතෝ ඝාතනය කෙරුණේ විරුද්ධ පක්ෂ නායිකාව ලෙස ජනාධිපතිවරණයට ඉදිරිපත්ව මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නිරතව සිටි අවස්ථාවකදීය. මේ සම්බන්ධයෙන් අධිකරණයට කරුණු ඉදිරිපත් කරමින් පාකිස්ථාන අපරාධ පරීක්ෂණ නිලධාරීන් ගොණු කළ චාර්තාවකින් මේ ඝාතනය 'තෙහ්රික් ඊ තලේබාන්' සංවිධානය මගින් සිදුකරන ලද්දක් බවත් එවක ජනාධිපතිව සිටි මුෂාරෆ් විසින් ඒ සඳහා අවස්ථාව ලබාදී ඇති බවත් අනාවරණය කෙරුණු අතර වරෙන්තු නිකුත් කෙරුණේ ඒ අනුවය.

පෙබරවාරි: 15.

ඉරානයේ ජනාධිපති මොහමඩ් අහමදිනේජාඩ්ගේ පාලනයට එරෙහිව එරට ජනතාව විදි බැස විරෝධතා අරඹති. එරට විපක්ෂය විසින් සංවිධානය කළ මේ විරෝධතාවලට විපක්ෂ නායකයන්ට සහභාගිවීමට ඉඩ නොතබමින් එරට පොලිසිය විපක්ෂ නායක හුසේනි මොසාඩ් ඇතුළු ප්‍රතිපක්ෂ නායකයන්ගේ නිවාස වටකොට ඔවුන් නිවාස අඩස්සියට පත්කරති. තෙහෙරාන් නුවරින් ඇරඹි විරෝධතාවලට පොලිසිය වෙඩි තැබීමෙන් අයෙක් ජීවිතක්ෂයට පත්ව තවත් පිරිසක් තුවාල ලබති.

පෙබරවාරි: 18.

ලිබියා ජනාධිපති මුවම්මර් අල් ගඩාෆිට සිය ධූරයෙන් ඉවත්වන ලෙස බල කරමින් එරට දෙවන විශාලතම නගරය ලෙස සැළකෙන බෙන්ගාසිහිදී පැවැති විරෝධතා ව්‍යාපාරයකට ගඩාෆිගේ අනුගාමිකයන් විසින් එල්ල කළ වෙඩි ප්‍රහාරයන්ට ගොදුරුව 24 දෙනෙකු ජීවිතක්ෂයට පත්වේ.

පෙබරවාරි: 19.

ඇෆ්ගනිස්ථානයේ බැංකුවකට එල්ල කෙරුණු මරාගෙන මැරෙන බෝම්බ සහ වෙඩි ප්‍රහාරයකින් 18 දෙනෙකු ජීවිතක්ෂයට පත්ව 48 දෙනෙකු තුවාල ලබති. නැගෙනහිර ඇෆ්ගනිස්ථානයේ ජලල්ලාබාද් නුවර බැංකුවකට මේ ප්‍රහාරය එල්ල කෙරුණේ රජයේ ආරක්ෂක නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් වෙත වැටුප් ගෙවීම් සිදුකෙරෙමින් පැවැති අවස්ථාවකදීය.

පෙබරවාරි: 20.

මොරොක්කෝවේ පාලක හයවන මොහමඩ් රජුගේ බලතල පාර්ලිමේන්තුවට පවරන ලෙස බල කරමින් එරට ජනතාව විදි බසිති. මොරොක්කෝ අගනුවරින් ඇරඹි විරෝධතා සෙසු නගරවලටද පැතිරේ.

පෙබරවාරි: 21.

නවසීලන්තයේ ක්‍රයිස්චර්චිහි ඇතිවූ ප්‍රබල භූමි කම්පාවකින් පුද්ගලයන් 75 දෙනෙකු ජීවිතක්ෂයට පත්වෙති. රික්ටර් මාපකයේ 6.3ක් ලෙස සටහන් වූ එම භූමි කම්පාව එරට මධ්‍යම රාත්‍රී 12.51ට සිදුවී ඇති අතර ඉන් ගොඩනැගිලි රාශියක් ද විනාශයට පත්විය.

පෙබරවාරි: 23.

රජයේ දූෂණ සහ වංචා හේතුවෙන් එරට භාණ්ඩ මිල අඩු ආදායම්ලාභීන්ට දරාගත නොහැකි ආකාරයෙන් ඉහල ගොස් ඇති බව කියමින් ඉන්දියාවේ නවදිල්ලි අගනුවරට පැමිණි දහස් ගණන් ජනතාව විරෝධතා ව්‍යාපාරයක් අරඹති. ඉන්දියා වෘත්තීය සමිති ඒකාබද්ධ මධ්‍යස්ථානය මගින් සංවිධානය කෙරුණු මේ විරෝධතා ප්‍රාන්ත 19ක සාර්ථක අයුරින් පැවැත්වේ.

පෙබරවාරි: 26.

වසර 80ක් තිස්සේ අයර්ලන්තයේ රාජ්‍ය බලය හිමිකරගෙන සිටි ෆියානා ෆේල් පක්ෂයට අන්ත පරාජයක් අත්කරදෙමින් මහ මැතිවරණයෙන් විපක්ෂය ජය ලබයි. කෝවන්ගේ ආණ්ඩුව ඉකුත් නොවැම්බර් මාසයේදී ජාත්‍යන්තර ආධාර වශයෙන් ඩොලර් බිලියන 85ක ණයක් ලබගැනීමට එරෙහිව පැනනැගුණු ජනතා විරෝධය පරාජයට මූලික හේතුව වූ බව දේශපාලන විචාරකයෝ පවසති.

ශ්‍රීලාල් සෙනෙවිරත්න

ඒකාධිපති පාලන තන්ත්‍රයන්ට සහ දූෂිත රාජ්‍ය පාලනයන්ට එරෙහිව රටවල් ගණනාවක ජනතාව විදි බැසීම පෙබරවාරි මාසයේ ලෝකයේ වෙසෙස් අවධානයට ලක්වූවේය. විශේෂයෙන්ම දීර්ඝ කාලයක් තිස්සේ ඒකාධිපති පාලනයන් ක්‍රියාත්මක වන අරාබි රටවල දේශපාලනය උඩු යටිකුරු කරන්නට මේ ජනතා නැගිටීම් සමත්වීම එක් අතකින් විශ්මය ජනකය. අරාබි ලෝකය කළඹඹමින් නැගි ආ ජනතා උද්ඝෝෂණ රැල්ල ඉකුත් ජනවාරි මාසයේදී ආරම්භ වූයේ ටියුනීසියාවෙනි. මෑත ඉතිහාසයේ ලොවට නව දේශපාලන ප්‍රවනතාවක් හඳුන්වාදුන් ඒ විරෝධතා ව්‍යාපාරය අවසන් වූයේ වසර 23ක් එරට ජනාධිපති පදවිය දැරූ බෙන් අලිගේ පාලනය බිඳවැටී ටියුනීසියාවේ පාලනය අන්තර්වාර ආණ්ඩුවක් අතට පත්වීමෙනි.

ඒකාධිපති පාලනයන්ගෙන් පීඩා විඳිමින් සිටි ලෝකයේ බොහෝ රටවල ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා හඬ නගන්නට පෙර නොවූ විරූ චිත්ත ධෛර්යයක් ලබාදෙන්නට ටියුනීසියාවේ දේශපාලන පෙරළිය සමත්විය. ඉකුත් ජනවාරි 17 දා රැකියා විරහිත උපාධිධාරියෙක් ඊජිප්තු පාර්ලිමේන්තුව ඉදිරිපිටට පැමිණ සිරුරට ගිනි තබාගෙන සිය දිවි නසා ගන්නේ මේ අතරය. ටියුනීසියා දේශපාලන පෙරළියෙන් කුළුගැන්වෙමින් සිටි ඊජිප්තු ජනතාවට එරට ඒකාධිපති පලානයට එරෙහිව නැගී සිටීමේ පළමු වෙඩි මුරය පත්තු කරනු ලැබුවේ මේ සිදුවීමය.

ඊජිප්තුවේ ෆේස් බුක් විප්ලවය

සිය මර්ධනකාරී පාලනය මගින් වසර 29ක් තිස්සේ ඊජිප්තුවේ අසහාය නායකයා ලෙස වැජඹෙමින් සිටියේ හොස්නි මුබාරක්ය. ඔහු සිටියේ එළැඹෙන සැප්තැම්බරයේ මැතිවරණයක් පවත්වා සිය පුත් ගමාල් ජනපති ධූරයට පත්කරන්නට සිහින දකිමිනි.
1928 මැයි 04 දින උපත ලද හොස්නි පාසල් අධ්‍යාපනය අවසන එරට හමුදා සේවයට ඇතුළත් වූ අතර 1949 වන විට ඊජිප්තු හමුදා ඇකඩමියේ උපාධිධාරියෙකු බවට පත්විය. 1950 වසරේදී ගුවන් නියමුවෙකු ලෙස එරට ගුවන් හමුදාවට එක්වූ හේ 1972 වන විට එරට ගුවන් හමුදාපති ධූරය දක්වා උසස්වීම් ලබන්නට සමත්විය. 1975 අප්‍රේල් මාසයේ ඔහු ඊජිප්තුවේ උප ජනාධිපති ධූරයට පත් කරන්නේ එවක ජනපති අන්වර් සදාත් විසිනි.

වසර හයක් ගිය තැන (1981 ඔක්තෝබර් 14 දා) ඊජිප්තුවේ ජනාධිපතිවරයා ලෙස හොස්නි මුබාරක් පත්වන්නේ ජනාධිපති අන්වර් සදාත් හමුදා භටයෙකුගේ වෙඩි ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. එතැන් සිට පාලක පක්ෂය වන ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයා බවටද පත්වෙමින් අබණ්ඩව ඊජිප්තුවේ අසහාය නායකයා ලෙස හොස්නි වැජඹුනේය. ඔහුගේ පාලනය දූෂණයෙන් සහ පීඩනයෙන් පෝෂණය කෙරුණු ක්‍රමයක් වූ අතර පාලන කාලය පුරා සිදුකළ දූෂිත ගනුදෙනුවලින් ඔහු අති විශාල ධනස්කන්ධයක් හිමිකරගෙන ඇති බව එරට විරුද්ධ පක්ෂ පවසති. දූෂිත පාලනයේ ප්‍රතිඵලයක් ලෙස පොදු ජනතාවගේ ජීවන තත්ත්වය පිරිහී, විරැකියාව ඉහළ ගොස් තිබිණ. බොහොමයක් අරාබි රාජ්‍ය නායකයන් මෙන් නොව හොස්නි සිය පාලන කාලය තුළ ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවලට ගැතිව කටයුතු කිරීම කැපී පෙනෙයි. එහෙයින් සෙසු අරාබි රටවල් කෙරෙහි වූ සතුරු ආකල්පය වෙනුවට ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල් ඊජිප්තුව සහ හොස්නි සම්බන්ධයෙන් දැරූයේ මිතුරු ආකල්පයකි. රට අභ්‍යන්තරයෙන් හෝ බාහිර වශයෙන් එල්ල වන බලවත් විරෝධතාවයන්ගෙන් තොරව සිය පාලනය ගෙන යන්නට එමගින් හොස්නිට අවස්ථාව උදාවිය.

ටියුනීසියා දේශපාලන පෙරළියෙන් පන්නරය ලබා සිටි ඊජිප්තු ජනතාව උපාධිධාරියාගේ සිය දිවි නසා ගැනීමෙන් පසු හොස්නිගේ පාලනයට එරෙහිව විදි බසින්නට පටන්ගත්හ. හොස්නිට ජනාධිපති ධූරයෙන් ඉල්ලා අස්වන ලෙස බලකරමින් ජනවාරි 25 ඇරඹි උද්ඝෝෂණ දිනෙන් දින උග්‍රවෙන්නට පටන් ගැනීමත් සමග ඒවා මර්ධනයට හමුදාව සහ පොලිසිය යෙදවීමට හොස්නි පියවර ගත්තේය. 27 දා හමුදා වෙඩි ප්‍රහාරයකින් කයිරෝ නුවර විරෝධතාකරුවෙකු ජීවිතක්ෂයට පත්වීමත් සමග විරෝධතාවන් වඩාත් තීව්‍ර වන්නට විය. ඊට ප්‍රතිචාර දක්වමින් 28දා රට පුරා ඇදිරි නීතිය පැනවූ හොස්නි විරෝධතා මර්ධනයට බලවත් උත්සාහයක් ගත්තේය. එහෙත් ඇඳිරි නීතිය පවා නොතකා දහස් ගනන් ජනතාව විදි බැස විරෝධතා පවත්වන්නට වූ අතර විරෝධතාකරුවන් වෙත හමුදාව එල්ල කළ වෙඩි ප්‍රහාර හේතුවෙන් 62 දෙනෙකු ජීවිතක්ෂයට පත්වූහ. තවත් විශාල පිරිසක් තුවාල ලැබූහ.

විරෝධතා පාලනය කළ නොහැකි තත්ත්වයකට පත්වෙද්දී

හොස්නිගේ කැබිනට් මණ්ඩලය ජනවාරි 29දා සිය ධූරවලින් ඉල්ලා අස්වූහ. කැබිනට් මණ්ඩලය ඉල්ලා අස්වුවද විරෝධතාකරුවන්ට බියෙන් තමන් ධූරයෙන් ඉල්ලා අස්නොවන බව හොස්නි ප්‍රකාශ කළේය. එහෙත් එසේ කියමින් සිය ධූරයේ වගකීම්වලින් යම් කොටසක් පැවරීම සඳහා හිටපු හමුදා නිලධාරියෙකු වන ඕමාර් සුලෙයිමාන් උප ජනාධිපති ලෙස පත්කරගැනීමට හෙතෙම ක්‍රියා කළේය. එහෙත් ඉන් විරෝධතාකරුවන්ගේ ඉල්ලීමේ වෙනසක් සිදුකරගන්නට හොස්නි අසමත් විය. පෙබරවාරි මාසය අවරඔන්නේ ලක්ෂ ගනන් ඊජිප්තු ජනතාව විදි බැස සිට රාජ්‍ය නායකයා ඉල්ලා අස්වන ලෙස බලකරමින් සිටියදීය. පෙබරවාරි 02 දා ජනතාව අමතන හොස්නි කියා සිටින්නේ එළැඹෙන සැප්තැම්බරයේ මැතිවරණයක් පවත්වන තෙක් තමන් ජනාධිපති ධූරයේ රැඳී සිටින බවය. එහෙත් සැප්තැම්බරයේ පැවැත්වෙන මැතිවරණයට තමන් හෝ සිය පුත් ගමාල් ඉදිරිපත් නොවන බවද ඔහු පැවසුවේය.

ඔහුගේ මේ ප්‍රකාශයන් නිසා වියරු වැටුණු උද්ඝෝෂකයෝ සිය විරෝධතා ව්‍යාපාර තව තවත් තීව්‍ර කළ අතර ඊට එරෙහිව එල්ල කළ ප්‍රහාර හේතුවෙන් සිය ගණනක් ජීවිතක්ෂයට පත්වූහ. ගැටුම් උග්‍ර අතට හැරෙද්දී හොස්නිගේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ද සිය ධූරවලින් ඉවත් වූ හමුත් හොස්නි තවදුරටත් ජනාධිපති ධූරයේ රැඳී සිටියේය. ඒ වන විටත් නගර ගණනාවක් සිය ග්‍රහණයට ගෙන සිටි විරෝධතාකරුවෝ පෙබරවාරි 11 දා රාත්‍රී ජනාධිපති මන්දිරය වටලා හොස්නිව පන්නා දැමීමට සැළසුම් කළහ. විරෝධතාකරුවන් එදින නම්කර තිබුණේ 'සමුගැනීමේ සිකුරුදා' ලෙසිනි. ඒ සැළසුම ක්‍රියාත්මක කරන්නට විරෝධතාකරුවන්ට ඉඩ නොතබමින් එදින සවස හොස්නි සිය ධූරයෙන් ඉල්ලා අස්වූයේ හමුදාවට පාලන බලතල ලබාදෙමිනි. හොස්නිගේ ඉල්ලා අස්වීම සැළවීමත් සමග විරෝධතාකරුවෝ ප්‍රීති ගෝෂා පවත්වමින් සිය ජය සමරන්නට පටන්ගත්හ. ඊජිප්තු දේශපාලනයේ සුවිශේෂී හැරවුම් ලක්ෂයක් ලෝක ඉතිහාසයට එක්වූයේ එලෙසිනි.

හොස්නි ඉල්ලා අස්වීමෙන් පසු එතෙක් රට තුළ පැවැති දේශපාලන අස්ථාවර තත්ත්වය වහාම වෙනස් වූයේ නැතත් රාජ්‍ය පාලනයේ සුබවාදී වෙනස්කම් ඇතිවන්නට පටන් ගත්තේය. පාලනය බාරගත් හමුදා මණ්ඩලය විසින් පෙබරවාරි 13දා එරට ව්‍යවස්ථාව අත්හිටවමින් පාර්ලිමේන්තුව විසුරුවා හැරියේය. දින දහයක් තුළදී නව ව්‍යවස්ථාවක් සම්පාදනය සඳහා අට දෙනෙකුගෙන් යුත් සිවිල් කමිටුවක් පත්කරනු ලැබුවේය. හොස්නි ඇමරිකා ගිතවාදියෙකුවීමේ ප්‍රතිඵලයක් ලෙස ඊජිප්තුව මැදින් ගලන සූවස් ඇල ඔස්සේ ගමන් කිරීමට වසර 32ක් තිස්සේ ඉරාන යාත්‍රාවලට පැවති තහංචියද නව අන්තර්වාර හමුදා පාලනය මගින් ඉවත් කරනු ලැබුවේය. දෙරට අතර එතෙක් පැවති අමනාපය දුරු කරමින් පෙබරවාරි 21ද ඉරාන යුද නැව් දෙකක් සූවස් ඇල ඔස්සේ සිරියාව වෙත යාත්‍රා කළේය.

37 වන පිටට